
කොට්ඨාශයේ මාර්ග සිතියම




උ

A1 ප්‍රධාන මාර්ගය
1 පිටිගලගොඩ මාර්ගය
2 ඔලගොඩ මාර්ගය
3 ගමගෙවත්ත මාර්ගය
4 අරඹෙකන්ද මාර්ගය
5 කන්දෙගෙවත්ත මාර්ගය
6 තොටේගෙවත්ත මාර්ගය
7 තල්පදිවල මාර්ගය

(c) ප්‍රධාන මාර්ග
නිවාස කිහිපයකට යන මාර්ග
සංවර්ධන කල කොටස (කොන්ක්‍රීට්)
අඩිපාර
සංවර්ධනය කිරීමට ඇති කොටස
ගංවතුරට හානි වූ කොටස
පාලම

පාසල
ග්‍රාම නිලධාරි කාර්යාලය
කෘ.ප.නි.ස කාර්යාලය
ස.ස.නි. කාර්යාලය
සංවර්ධන නිලධාරි කාර්යාලය
හදිසි මරණ පරීක්ෂක
විවාහ රෙජිස්ට්‍රාර්
සුසාන භූමිය

කොට්ඨාශයේ නිවාස සිතියම




උ

A1 ප්‍රධාන මාර්ගය
1 පිටිගලගොඩ මාර්ගය
2 ඔලගොඩ මාර්ගය
3 ගමගෙවත්ත මාර්ගය
4 අරඹෙකන්ද මාර්ගය
5 කන්දෙගෙවත්ත මාර්ගය
6 තොටේගෙවත්ත මාර්ගය
7 තල්පදිවල මාර්ගය


- නිවාස
- සිල්ලර කඩ
- බාබර් සාප්පු
- ටේලර් සාප්පු

- පාසල
- ග්‍රාම නිලධාරි කාර්යාලය
- කෘ.ප.නි.ස කාර්යාලය
- ස.ස.නි. කාර්යාලය
- සංවර්ධන නිලධාරි කාර්යාලය
- හදිසි මරණ පරීක්ෂක
- විවාහ රෙජිස්ට්‍රාර්
- සුසාන භූමිය

කොට්ඨාශයේ දොල මාර්ග අමුණු සිතියම



කොට්ඨාශයේ ආපදා සිතියම



නායයෑම් අවදානම් ප්‍රදේශය

ගංවතුර අවදානම් ප්‍රදේශය

01. වසමේ නම

788 මාකලන්දාව

02. හැඳින්වීම

788 මාකලන්දාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මධ්‍යම කොටසේ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශයකි. මෙහි භූමි ප්‍රමාණය 124h පමණ වේ. ගෘහ ඒකක 172 ක් වේ. මෙහි ජනඝනත්වය හෙක්ටයාර් 1 ට 5.69 ක් වේ.

මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාසය ග්‍රාමීය ප්‍රදේශයකි. අයත්වන ගම්මාන ලෙස කන්දෙගෙවත්ත, පිටිගලගොඩ, තොටේගෙවත්ත, ඔලගොඩ, තල්පැදිවල කොටසක් අයත්වේ. මෙම කොට්ඨාශයේ භූ විෂමතාවය රළු සහිත බවක් ගනී. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27^0C පමණ වේ. ප්‍රදාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන කාලය නිරිත දිග මෝසම් ක්‍රියාත්මක වන කාලයයි.

788 මාකලන්දාව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මායිම්

උතුරු	-	849 B වෙදවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශය
දකුණ	-	788 A මාකලන්දාව දකුණ කොට්ඨාශය
නැගෙනහිර	-	850 D පැලවත්ත බටහිර උතුර කොට්ඨාශය
බටහිර	-	789 A ගුලවිට දකුණ කොට්ඨාසය

ග්‍රාම නිලධාරී කොට්ඨශයට ප්‍රවේශ විය හැකි ගමන් මාර්ගය

1. ප්‍රධාන නගර වල සිට

කළුතර නගරයේ සිට ගාලු පාර ඔස්සේ අළුත්ගම දෙසට පැමිණ කටුකුරුන්ද හන්දියෙන් වම්පසට හැරී මතුගමට පැමිණ මතුගම අළුත්ගම මාර්ගය ඔස්සේ පැමිණ හොරවල හන්දියෙන් වම්පසට ඇති මාර්ගයේ පැමිණ නැවත මීගහතැන්න හන්දියෙන් දකුණට ඇති අවිත්තාව මාර්ගයේ ගමන්කිරීමේදී ග්‍රාම නිලධාරී කොට්ඨාශ 2 පසුකරමින් 2.5km පමණ පැමිණීමේදී මෙම කොට්ඨාශයට ලගාවිය හැකිය.

2. අළුත්ගම නගරයේ සිට

අළුත්ගම මතුගම මාර්ගයේ ලෙව්වන්දූවට පැමිණ එතැනින් දකුණුපසට ඇති මාර්ගයේ පැමිණ ඉත්තෑපාන පසුකර අවිත්තාව හන්දියට පැමිණිය යුතුය. වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පසු කරමින් වලල්ලාවිට හන්දියට පැමිණිය හැකිය. වලල්ලාවිට හන්දියෙන් මීගහතැන්න මාර්ගයේ පැමිණ ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකක් පසුකර යාමේදී මෙම කොට්ඨාශයට ළඟා විය හැකිය.

3. ඇල්පිටිය නගරයේ සිට

ඇල්පිටිය පැලවත්ත මාර්ගයේ කි.මි. 2 ක් පමණ පැමිණ එතැන වම් පසට ඇති අවිත්තාව මාර්ගයේ අවිත්තාව පසුකර අවිත්තාව වලල්ලාවිට මාර්ගයේ කි.මි. 7 ක් පමණ පැමිණෙන විට වලල්ලාවිට ප්‍රා.ලේ. කාර්යාලය පසු කරමින් වලල්ලාවිට හන්දියෙන් මීගහතැන්න මාර්ගයේ ග්‍රාමනිධාරි කොට්ඨාශ 2 පසුකරමින් මෙම කොට්ඨාශයට ළඟා විය හැකිය.

4. පැලවත්ත මාර්ගයේ සිට

පැලවත්ත නගරයේ සිට පැලවත්ත මතුගම මාර්ගයේ පැමිණීමේදී පාලම අසලින් වම්පසට ඇති මගුරුමස්විල මාර්ගයේ පැමිණ මගුරුමස් විල හන්දියෙන් දකුණට පැමිණීමේදී මෙම කොට්ඨාශයට ළඟාවිය හැකිය.

පැලවත්ත නගරයේ සිට පැලවත්ත මතුගම මාර්ගයේ මීගහතැන්න හන්දියෙන් වම්පසට ඇති අවිත්තාව මාර්ගයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 3 පසුකරමින් කි.මි. 2.5 ක් පමණ පැමිණීමේදී මෙම 788 මාකලන්දාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයට ළඟා විය හැකිය.

<u>ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම නිර්මාණය වූ ආකාරය සහ ඓතිහාසික පසුබිම</u>

දකුණින් හිනිදුම් පත්තුව, ගාලු කෝරලය හා බෙන්තර ගඟත්රයිගම් කෝරලයත් නැගෙනහිරින් රයිගම් - කුකුලු දෙකොරලයත්, බටහිර බෙන්තර කළු දෙගම්මෝය අතර, වෙරළ තීරයත් මායිම් වූ විශාල භූමි ප්‍රදේශය පස්යොදුන් රට නමින් හැඳින්වේ. ඉතිහාසය හා බැඳුනු වකවානුවල සිටම පස්යොදුන් රටද වෙනත් ප්‍රදේශ මෙන්ම කෝරළ පත්තු ආදී වශයෙන් ප්‍රාදේශිය ඒකක වලට බෙදා පාලනය කරන ලදී. ඒ අනුව වලල්ලාවිට ප්‍රා.ලේ. කොට්ඨාසය එකී පස්යොදුන් රටේ නැගෙනහිරින් මහ පත්තුවේ දක්ෂිණ ප්‍රදේශයට අයත් විය.

මෙහි වලල්ලාවිට ප්‍රා.ලේ. කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 60 කින් නිර්මාණය වී ඇති අතර, 788 මාකලන්දාව එහි එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකි. සමස්තයක් ලෙස වලල්ලාවිට ප්‍රා.ලේ. කොට්ටඨාසයට ඓතිහාසික වශයෙන් එක් එක් වකවානුවලදී විවිධ පුරාවෘත්තයන් මතුකර ගත හැකිය.

ඒ යටතේ,

''මාකලන්දාව ග්‍රාමය'' පිළිබඳව පුරාවෘත්ත සොයා යෑමේදී මෙම නාමයට පටබැඳි ඇති ආකාරය ජනප්‍රවාදයේ මෙසේ සඳහන් වේ. එම කතිකාව අනුරාධපුර යුගයේ අනුලා බිසව දක්වා දිව යයි. ඇය එකල අතිශය ශක්තිමත් කාන්තාවක් වූ අතර එකල රජවරුන් ඝාතනය කරවීම එකල ඇය විසින් සිදු කරනු කෲර ක්‍රියාවකි. ඒ වකවානුවේදී මකලන්තිස්ස නොහොත් චෝර නාග කුමාරවරුන්ටත් මේ අනුලා දේවියගෙන් තම ජීවිතය රැක ගැනීමට එම ප්‍රදේශයෙන් පලාවිත් සැඟවී සිටියේ වර්තමානයේ මාකලන්දාව නමින් හඳුන්වන ප්‍රදේශයේ ගිරිදුර්ගයකයි. මාකලන්තිස්ස කුමරු සැඟවී සිටි ගිරිදුර්ගය පිහිටා තිබුණු නිසා මාකලන්දාව ලෙස භාවිත කර ඇති බව පැරැන්නන්ගේ මතයයි.

මෙම මාකලන්තිස්ස කුමරු මෙම ගිරිදුර්ගයට බටහිරින් අනුලා බිසවගේ සතුරු සේනාවට මුහුණ දීමට සහ ආරක්ෂා වීමට කටුවලින් තැනූ ද්වාරයක් තනා තිබූ අතර, එම කටුදොර වර්තමානයේ කටුදොල ලෙස භාවිතා කරන ග්‍රාමයයි.

එසේම නැගෙනහිර දෙසින් සතුරු සේනාවට මුහුණ දීමට හේවායින් විස්සක් යොදවා තිබූ අතර එම පුරාවෘත්තයට අනුව හේවායින් විස්සක් යොදවා තිබූ නිසා හේවා විස්ස හෙවෙස්ස ලෙස වත්මන් භාවිත වේ. උතුරු දෙසින් මුරකාවල් යොදා තිබූ ගලක් පිහිටා තිබූ ප්‍රදේශය මුරගල වත්මන මොරගල ලෙස භාවිත වේ.

එසේම චෛරනාග හෙවත් මාකලන්තිස්ස කුමරු සැඟවී සිටි දුර්ගයට උතුරු දෙසින් බලගල නැමැති කඳු ප්‍රදේශයක් පිහිටා තිබූ අතර මෙම මාකලන්තිස්ස කුමාරවරුන් ආහාර ගැනීමට පළතුරු වර්ග රාශියක් මෙම වනගත ප්‍රදේශයේ වගාකොට තිබූ අතර, අදටත් එම පළතුරු බහුල වශයෙන් එම ප්‍රදේශයේ දක්නට ලැබේ. එම පළතුරු එම ප්‍රදේශය තුලදීම වුවමනා ප්‍රමාණයට ආහාර ගැනීමට හැකි මුත් කිසිදු පළතුරක් එම සීමාවෙන් මෙපිටට ගෙන ඒමට නොහැකි වන ලෙස අත්භූත බලවේගයක් ක්‍රියාත්මක වන බව පැරැන්නෝ පවසති.

ස්වභාවික සෞන්දර්යය

අතිශය සුන්දර වටපිටාවකින් හෙබි මෙම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස අතුරින් මෙම ග්‍රාම කොට්ඨාසය කුඩා කොට්ඨාසයක් වුවද එම ප්‍රදේශයේ පවතින මද රැලි සහිත කලාපයක් නිසාත් කඳු පාමුල පහත් බිම් වල වී වගාව පැතිරී ඇති අතර සිහිල් සුළං රැල් නිරතුරුවම කොට්ඨාසය හරහා හමා යයි.

පූජනීය ස්ථාන

පිටවගුර ප්‍රදේශයේ ඇති බෝධීන් වහන්සේ

මීගහතැන්න වලල්ලාවිට ප්‍රධාන මාර්ගය හරහා ගමන් කිරීමේදී ප්‍රධාන මාර්ගයට ආසන්නයේ මාකලන්දාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජනතාව පුද පූජා කිරීමට පැමිණෙයි. ප්‍රදේශයේ ජනතාවගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් මෙම බෝධීන් වහන්සේ සංවර්ධනය කරමින් ජනතාව වැඳුම් පිදුම් කරනු ලබයි. මෙම බෝධීන් වහන්සේ හාස්කම් සහිත බව ඔවුන්ගේ මතයයි.

කොට්ඨාසයේ පිහිටා ඇති පාසල්

මාකලන්දාව ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලය

පළමු ශ්‍රේණියේ සිට අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ගැනීමට පහදසුකම් ඇති මෙම පාසල් භූමිය අක්කරයක පමණ භූමි ප්‍රදේශයක කඳු ගැටයක පිහිටා ඇත. මීගහතැන්න, වලල්ලාවිට ප්‍රධාන මාර්ගය ආසන්නයේ පිහිටා ඇත.

ගුරුවරු සංඛ්‍යාව	24
සිසුන් සංඛ්‍යාව	251